## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2014

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් හා වියදම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගන්නා අවස්ථාවේදී වූ උපචිත පොලිය රු.3,358,082 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ලැබිය

යුතු ආයෝජන පොලී ආදායම වැඩියෙන් හා ආයෝජනවල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අර්ථසාධක දායක මුදල් ලැබීම් නිශ්චිතව හඳුනා නොගැනීම හා වැරදි ගිණුම්ගත කිරීම නිසා සිදු වූ හඳුනානොගත් හර හා බැර ශේෂ පිළිවෙලින් රු.7,776,647 ක් හා රු.85,823 ක් විය. මෙම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද අර්ථසාධක අරමුදල සඳහා සියලුම දායකයන් විසින් ගෙවනු ලැබූ දායක මුදල් සහ රාජ්‍ය දායක කොටසේ මුළු එකතුව රු. 40,931,305,378 ක මුදල ජංගම නොවන වගකීම් ලෙස දක්වනවා වෙනුවට හිමිකම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**2.2.2** විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගනුදෙනු සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(අ) අරමුදල වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබූ හෙයින්, වර්ෂය අවසානයේ අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය වූ රු. 16,166,898,487 ක මුදල පරීක්ෂා කිරීමට නොහැකි විය. මෙයට අතිරේකව අරමුදලට අනිවාර්ය දායක ගෙවීම සිදු කරන දායකයින්ගෙන් ලැබිය යුතු හිඟ ශේෂයන්ද ගණනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු. 381,356,811 ක දායක මුදල් දායකයින් වෙත ගෙවා තිබූ නමුත් ඉහත තත්ත්වය යටතේ එම ගෙවීම්වල නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) ස්වේච්ඡා දායක මුදල් ගෙවන දායකයින් වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා නොතිබූ බැවින් වර්ෂය අවසානයට දක්වා ඇති ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ රු. 24,542,030 ක ශේෂයේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි විය.

**2.3** නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අඥා පනතේ (621 අධිකාරිය) | |
| (i) 2 (2) වගන්තිය | එක් එක් දායකයා වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා ගත යුතු වුවත්, අරමුදලේ ආරම්භයේ සිටම කේවල ගිණුම් පවත්වා නොතිබුණි. |
| (ii) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 7 (1) වගන්තිය | සියයට 12 ක් වූ රජයේ දායකත්වය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගෙන් ගෙන්වා ගත යුතු වුවද, පනත සංශෝධනයකින් තොරව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සියයට 12 ක් වූ රජයේ දායකත්වය අදාල ආයතනවලින්ම ගෙන්වා ගැනීමට කටයුතු කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 395 (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම පිළියෙල කිරීම සඳහා මාස 06 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | සමාලෝචිත වර්ෂයේ නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වී ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 120,206 ක් වූ චෙක්පත් 03 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 486 | සමාලෝචිත වර්ෂයේදී ලැබී අගරු වී තිබූ රු. 595,258 ක් වටිනා දායක මුදල් චෙක්පත් 29 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ දක්වා ඇති ශුද්ධ අගය රු.266,835 ක් වූ ස්ථාවර වත්කම් පරීක්ෂා කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.3,227,101,270 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,757,264,050 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 469,837,220 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෑම මාසයකදීම අරමුදලට බැර කරනු ලබන මුදල් පිළිබඳ නිවේදනයක් ඊලඟ මාසයේ 15 දිනට පෙර අරමුදලේ ලේකම් වෙත අදාළ ආයතන විසින් එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මෙම නිවේදන එවා තිබුණේ ආයතන කිහිපයකින් පමණක් බැවින් එම වාර්තා නිසි පරිදි ගෙන්වා ගැනීමට කළමනාකාරීත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) තානාපති සේවයේ නියුක්ත නිලධාරීන් 4 දෙනෙකුගේ දායක මුදල් අරමුදලට ප්‍රේෂණය කිරීම, මාස 06 කට වැඩි කාලයක සිට සිදු වුවද, මෙතෙක් එම දායකයින්ට ඔවුනට හිමි දායක අංක ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා අර්ථසාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ සභාපතිගේ 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙහි 08 ඡේදය පරිදි තානාපති කාර්යාල 28 කින් සහ මධ්‍යම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අවකරණ ලැයිස්තු ලබාගැනීමට ප්‍රමාණවත් වූ පියවරයන් ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී දායක මුදල් ආපසු ගෙවීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී දායකයා අයත්වන රාජකාරි ස්ථානයේ ලිපිනය නිවැරදිව සටහන් නොකිරීම නිසා අවස්ථා 17 කදි රු. 1,142,503 ක් වූ චෙක්පත් ආපසු එවා තිබුණි.

(ඉ) 2010, 2013, 2014 වර්ෂවලදී ඉල්ලුම් කරන ලද දායක මුදල් අයදුම්පත් 5 ක් සඳහා ලියාපදිංචි අංක නොමැතිවීම, අවකරණ විස්තර නොමැතිවීම සහ මුදල් එවූ බවට තහවුරු නොතිබීම මත ප්‍රතිලාභ ගෙවීම් කර නොතිබුණද අරමුදලේ දත්ත කළමනාකරණය කිරීමේ දුර්වලතා හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම සමාලෝචිත වර්ෂය දක්වාත් සිදු වී නොතිබුණි.

**4.2** හඳුනාගන්නා ලද පාඩු

---

භාණ්ඩාගාර ලේකම් වෙතින් ලැබිය යුතු සියයට 12 ක් වූ රජයේ ප්‍රසාද මුදල අරමුදල වෙත නොලැබීම හේතුවෙන් එම මුදල් ආයෝජනය කිරීම මගින් උපයාගත හැකිව තිබුණු පොළී ආදායම් අහිමි වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ ලැබිය යුතු රජයේ ප්‍රසාද මුදල වන රු.2,331,391,669 ක මුදල සමාලෝචිත වර්ෂයට අදාලව ගණනය කළ සාමාන්‍ය භාණ්ඩාගාර බැඳුම්කර පොළිය වූ සියයට 8.8 කට ආයෝජනය කිරීමට නොහැකිවීමෙන් රු. 205,162,467 ක පොළී ආදායමක් අහිමි වී තිබුණි.

**4.3** කාර්යසාධනය

---

අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍ර අතුරින් අයදුම්පත් 3,646 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවීම් කර නොතිබුණි.

**5.** පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අවධානයට යොමු කර තිබුණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආයෝජනය

(ඇ) අයවැය පාලනය